# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 24/12/2023<br>පැය |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. 2023.12.23වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 01 | 33,750 | 1070 | බැරල් 08<br>බුලි 01<br>තඹ දඟර 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2023.12.23 වන දින දිවා කාලයේ මීගහවත්ත පොලිස් වසමේ දී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත දෙමළගම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 700 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගහවත්ත පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන අහුගම්මන, දෙමළගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මීගහවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **නීති විරෝධිලෙස මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ ක්‍රියාකාරකම් මැඩලීමේ ඒකකය.**

2023.12.23 වන දින රාත්‍රී කාලයේ රාගම පොලිස් වසමේ හින්කෙන්ද, රාගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මැඩලීමේ ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධීව දුම්වැටි 700 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වන හින්කෙන්ද, රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **නීති විරෝධි ලෙස මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2023.12.23 වන දින දිවා කාලයේ මීගමුව පොලිස් වසමේ හලාවත පාර පෙරියමුල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි දුම්වැටි1905 ක්, මුදල් රුපියල් 9,500/=සහ ජංගම දුරකථනයක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුර.**

2023.12.23 වන දින දිවා කාලයේ නෙල්ලිඅඩි පොලිස් වසමේ දී පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු මිලි ලීටර් 180 ප්‍රමාණයේ බෝතල් 84ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් මත් පැන් අලෙවි කල මුදල් බවට සැක කරන මුදල් රුපියල් 2,100/=ක්ද සමඟ** අත්අඩංගුවට ගෙන නෙල්ලිඅඩි පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 34 ක් වන කරවෙඩ්ඩි ප්‍රදේශයේ පදිංචිකාරිනියක් වේ. නෙල්ලිඅඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**